# 2024-01-29 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. Bill and Melinda Gates Foundation මඟින් ජනාධිපති කාර්යාලය වෙත ලබා දීමට යෝජිත ප්‍රතිපත්තිමය සහාය**

ජනාධිපති කාර්යාලය විසින් ප්‍රතිපත්තිමය කරුණුවලට මග පෙන්වීම සහ රජයේ වැඩසටහන් අධීක්ෂණය කිරීම යන කාර්යයන් ඉටු කරමින් දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ වැඩසටහන තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එහිදී විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම, ලෝක බැංකුවේ සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති ආධාර වැඩසටහන් වැනි බහුපාර්ශ්වික ආයතන ගණනාවක් සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යාම මෙන්ම විවිධ රාජ්‍ය සහ පෞද්ගලික අංශ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම ද සිදු කරනු ලබයි. එකී වැඩසටහන්වලට අදාළව ජනාධිපති කාර්යාලයට සහාය වීම සඳහා වැඩසටහන් ආධාර ඒකකයක් ස්ථාපිත කරමින් ශ්‍රී ලංකා රජයට ක්‍රියාකාරී දායකත්වය සපයන හවුල්කරුවන් ලෙස ක්‍රියා කිරීම පිණිස ලෝකයේ විශාලතම පුණ්‍ය පදනමක් වන Bill and Melinda Gates Foundation විසින් ස්ථාපිත කර ඇති ජාත්‍යන්තර සංවිධානයක් වන Global Health Strategies සහ එම ආයතනයේ දේශීය හවුල්කරුවන් වන Connect To Care සංවිධානය එකඟතාව පළ කර තිබේ. Bill and Melinda Gates Foundation විසින් ශ්‍රී ලංකා රජය වෙත සහාය දැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය සම්බන්ධීකරණය ඇති කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුවක් ස්ථාපිත කරනු ඇත. Bill and Melinda Gates Foundation විසින් ජනාධිපති ලේකම් කාර්යාලයට ලබා දීමට යෝජිත ප්‍රතිපත්තිමය සහාය පිළිබඳව ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදුව, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

**02. සීමාකාරී තත්ත්වයන්ට යටත්ව කළුගල් අපනයනය කිරීම**

රට තුළ මේ වන විට ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කළුගල් අවශ්‍යතාව සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතීම හේතුවෙන් කළුගල් කැණීම් කර්මාන්තයේ නිරත කැණීම්කරුවන් හා ඒ හා සම්බන්ධිත ප්‍රජාවන්ගේ ජීවනෝපාය මාර්ගයන්ට දැඩි බලපෑමක් ඇති

වී තිබේ. එම තත්ත්වය සැලකිල්ලට ගනිමින් සීමාකාරී තත්ත්වයන්ට යටත්ව කළුගල් අපනයනය තුළින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ඉපයීමේ වැඩපිළිවෙලක් කෙටිකාලීනව ක්‍රියාත්මක කිරීමේ යෝග්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. හම්බන්තොට මාගම්පුර වරාය ඉදි කිරීමේදී ඉවත් කරන ලද කළුගල් තොගයක් දැනට එම වරාය භූමියේ පරිපාලන ගොඩනැගිල්ල අසල හා හම්බන්තොට නව රෝහල් පරිශ්‍රයේ ගොඩ ගසා ඇති අතර එකී කළුගල් තොග කඩිනමින් ඉවත් කළ යුතුව පවතී. පරිසර ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගනිමින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධීක්ෂණය යටතේ එකී කළුගල් තොග කඩිනමින් අපනයනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස අනුමැතිය ලබා දීමටත්, කළුගල් මෙට්‍රික්ටොන් මිලියනයක් දක්වා අපනයනය කිරීමේ හැකියාව සහ යෝග්‍යතාව පිළිබඳව කරුණු අධ්‍යයනය කර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස කමිටුවක් පත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

## 03. මන්නාරම් දූපතේ සුළං ගොවිපොළ ව්‍යාපෘති සංවර්ධනය

මන්නාරම් දූපතේ සුළං බල මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 47ක මුදලක් වැය කර අතිරේක ටර්බයින 06ක් සවි කිරීම මඟින් විදුලි උත්පාදනය ඉහළ නැංවීම පිණිස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2020-10-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එහෙත්, රජයේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන තෙක් ආසියානු සංවර්ධන බැංකු අරමුදල් භාවිත කිරීමට හැකියාවක් නොමැත. එබැවින්, වසර 20ක මෙහෙයුම් කාලසීමාවක් සහිතව ඉදි කිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම යටතේ තරඟකාරී පදනම මත තෝරාගනු ලබන පුද්ගලික අංශයේ ආයෝජකයින් මඟින් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. 2024 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවන් වෙනුවෙන් ආහාර ද්‍රව්‍ය (අමු, වියළි සලාක සහ වෙනත්) සැපයුම් කිරීමේ ප්‍රසම්පාදනය

2024 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාවන් වෙනුවෙන් ආහාර ද්‍රව්‍ය (අමු, වියළි සලාක සහ වෙනත්) සැපයුම් කිරීමේ ප්‍රසම්පාදනය රුපියල් බිලියන 84.2ක (වැට් රහිත) මුළු වටිනාකමකට අමාත්‍ය මණ්ඩලය විසින් පත්

කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මඟින් නිර්දේශිත සැපයුම්කරුවන් වෙත පිරිනැමීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. ජාතික ණය සුරැකුම් ආයතනයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහන සැලසීමේ අරමුණින් ජාතික ණය සුරැකුම් ආයතනය ස්ථාපිත කිරීම සඳහා 2021-04-27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මේ වන විට එම ආයතනය පොදු සීමිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කර ඇති අතර, එහි මූලික ප්‍රාග්ධනය වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. ඒ අනුව, ජාතික ණය සුරැකුම් ආයතනයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනා ලදී.

## 06. 2023/24 මහ කන්නයේ වී මිල දී ගැනීමේ වැඩසටහන

2023/24 මහ කන්නයේ වී මිල දී ගැනීම සඳහා සහනදායී පොළී අනුපාතයක් යටතේ රාජ්‍ය හා පෞද්ගලික බැංකු හරහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, පසුගිය වර්ෂ 05ක මහ කන්නවලදී එක් එක් දිස්ත්‍රික්කයේ සාමාන්‍ය නිෂ්පාදනය පාදක කරගනිමින් ණය අරමුදල් වෙන් කරනු ඇත. යෝජිත ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් බිලියන 09ක ඔඩපණ ණය නිකුත් කිරීමට අපේක්ෂා කරනු ලබයි. සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා උපරිම වශයෙන් රුපියල් මිලියන 50ක් ද, වී ගබඩා හිමිකරුවන් සහ වී තොග රැස් කරන්නන් සඳහා උපරිම වශයෙන් රුපියල් මිලියන 25ක් ද වන පරිදි ණය මුදල් ලබා දෙනු ඇත. ණය ආපසු ගෙවීමේ කාලසීමාව දින 180ක් වේ. 15%ක් වන වාර්ෂික පොළී අනුපාතයෙන් 4%ක් මහා භාණ්ඩාගාරය විසින් දරනු ඇත. ඒ අනුව, යෝජිත වී මිල දී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **2024 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම**

විදේශ විනිමය වෙළඳපොළ මත ඇතිව තිබෙන පීඩනය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ඉදිකිරීම් වාහන සහ ගිලන් රථ හැර මෝටර් රථ ආනයනය කිරීම රජය විසින් මේ වන විට තාවකාලිකව අත්හිටුවා ඇත. කෙසේ වුවද, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ භාවිතය සඳහා රැඹේ රථ 03ක් ආනයනය කිරීමට, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මඟින් පරිත්‍යාග කරන ලද ජංගම මාතෘ ඒකක 03ක් හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් සපයනු ලබන ද්විත්ව කැබ් රථ 21ක් ලබා ගැනීමට, රැකියා බලපත්‍ර ක්‍රමය ස්ථාපිත කිරීමේදී ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර එළඹී ගිවිසුම් අනුව කොරියානු අරමුදල් ව්‍යාපෘතිය සඳහා සපයනු ලබන මෝටර් රථයක් ලබා ගැනීමට සහ ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සැපයෙන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා බස් රථ 02ක් සපයාගැනීමට පිළිවෙළින් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීමට 2023-12-11 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, එකී මෝටර් වාහන ආනයනය කිරීමට හැකි වන පරිදි, අංක 2366/19 දරන 2024-01-11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ සාදන ලද 2024 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම**

බැංකු බලපත්‍ර නිකුත් කිරීම, බැංකු හිමිකාරිත්වය, ඒකාබද්ධ අධීක්ෂණය, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතා රාමුව, ලබා දිය හැකි උපරිම ණය පහසුකම් ප්‍රමාණය සහ සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනු, යහපාලන අවශ්‍යතා, රාජ්‍ය බැංකුවල නියාමනය සහ අධීක්ෂණය ඇතුළු ක්ෂේත්‍රවල පවත්නා නියාමන ප්‍රමිතීන් ශක්තිමත් කිරීමට හැකි වන පරිදි විධිවිධාන ඇතුළත් කරමින් 1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2023-06-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක

විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. ගැසට් නිවේදන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

ආනයනික කිරිපිටි සඳහා 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනතේ විධිවිධාන පරිදි 10%ක බද්දක් පනවමින් 2023-09-21 දින ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියෝගය සහ 2024-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය 15% සිට 18% දක්වා වැඩි කිරීමට අදාළව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන පරිදි 2023-12-19 දින ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝග සංශෝධනය කිරීම

බිම් කැබලි අනුබෙදීම, ඇතැම් බිම් කැබලිවල පරිහරණය වෙනස් කිරීම සහ තාක්ෂණික නොවන නිවැරදි කිරීම් කිහිපයක් ඇතුළත්ව, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි නිකුත් කරනු ලැබ ඇති 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝග සංශෝධනය කරමින් අංක 2358/70 දරන 2023-11-17 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් නියෝග ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වැඩබලන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ තායිලන්ත රාජ්‍යයේ රජය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම**

ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා 2018-06-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඉන් අනතුරුව, තායිලන්ත පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති සංශෝධන ද ඇතුළත් කරමින් සකස් කරනු ලැබ ඇති ගුවන් සේවා ගිවිසුමට නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලැබී තිබේ. ඒ අනුව, දෙරට අතර යෝජිත ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමට අත්සන් තැබීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ආයෝජන යටිතල පහසුකම් සංස්ථාව ස්ථාපිත කිරීම**

ආයෝජකයින් සඳහා අවශ්‍ය ඒකාබද්ධ යටිතල පහසුකම් සැපයීමේ අරමුණින් ආයෝජන ප්‍රවර්ධන කලාප ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම පිණිස ආයෝජන යටිතල පහසුකම් සංස්ථාව නමින් ව්‍යවස්ථාපිත ආයතනයක් ස්ථාපිත කිරීමටත්, මාර්ග, විදුලිය, ජලය සහ නිවාස වැනි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ආයෝජන ප්‍රවර්ධන කලාප වෙත සැපයීමේ වගකීම එම සංස්ථාව වෙත පැවරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **රාජ්‍ය ආයතන අතර පැන නැගෙන ආරවුල් විසඳීම සඳහා නෛතික විධිවිධාන හඳුන්වා දීම**

රාජ්‍ය ආයතන අතර පැන නැගෙන ආරවුල් කඩිනමින් විසඳා ගැනීමට හැකි වන පරිදි යෝග්‍ය නීතිමය විධිවිධාන හඳුන්වා දීමේ අවශ්‍යතාව පෙනී ගොස් ඇත. ඒ අනුව, නීතිපති විමසමින් ඒ සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙසට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 14. අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය

දැනට ක්‍රියාත්මක කරනු ලැබ ඇති අස්වැසුම් සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය පහත සඳහන් සංශෝධනයන් ඇතුළත්ව ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අස්වැසුම සුදුසුකම්ලාභී සමාජ කාණ්ඩ අතරින් අවදානමට ලක් වූ සමාජ කාණ්ඩය සඳහා ප්‍රතිලාභ හිමි වලංගු කාලය 2024-04-01 දින සිට 2024-12-31 දින දක්වාත්, සංක්‍රාන්තික සමාජ කාණ්ඩය (ආර්ථික අර්බුදය හේතුවෙන් තාවකාලිකව ආදායම පහළ වැටී ඇති) සඳහා ප්‍රතිලාභ හිමි වලංගු කාලය 2024-01-01 දින සිට 2024-12-31 දින දක්වාත් දීර්ඝ කිරීම.

  දැනට පවත්නා අවදානමට ලක් වූ සමාජ කාණ්ඩය හා සංක්‍රාන්තික සමාජ කාණ්ඩය (ආර්ථික අර්බුදය හේතුවෙන් තාවකාලිකව ආදායම පහළ වැටී ඇති) යන කාණ්ඩ දෙක ඒකාබද්ධ කර පවුල් ලක්ෂ අටක් සඳහා අවදානමට ලක් වූ කාණ්ඩය ලෙස 2024-01-01 දින සිට සැලකීම සහ එම පවුල් සඳහා රුපියල් 5,000/-ක දීමනාවක් එදින සිට 2024-12-31 දින දක්වා ගෙවීම.

  තොරතුරු සහතික කිරීමේ ක්‍රියාවලියකින් පසුව අස්වැසුම පවුල් ලැයිස්තුවට අයත් හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගී පුද්ගලයින් සඳහා රුපියල් 7,500/-ක්, ආබාධිත පුද්ගලයින් සඳහා රුපියල් 7,500/-ක් හා වැඩිහිටි පුද්ගලයින් සඳහා රුපියල් 3,000/-ක් වශයෙන් 2024 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මාසික දීමනාවක් ගෙවීම.

  දැනට දීමනා ලබන සහ පොරොත්තු ලේඛනවල ලියාපදිංචිව සිටින හේතුව හඳුනා නොගත් වකුගඩු රෝගී පුද්ගලයින් සඳහා රුපියල් 7,500/-ක්, ආබාධිත පුද්ගලයින් සඳහා රුපියල් 7,500/-ක් හා වැඩිහිටි පුද්ගලයින් සඳහා රුපියල් 3,000/-ක් වශයෙන් 2024-01-01 දින සිට

ක්‍රියාත්මක වන පරිදි වැඩි කර මෙම ගෙවීම් අස්වැසුම වැඩසටහනට බාහිර වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් සිදු කිරීම.

දෙවන වටය සඳහා අයදුම්පත් කැඳවීම 2024 පළමු කාර්තුව තුළ දී ආරම්භ කර 2024 ජුනි මාසය තුළ දී අවසන් කර ජූලි මාසයේ සිට ගෙවීම් සිදු කිරීම සහ අතිරේකව සුදුසුකම් ලබන පවුල් ඇතුළත් කිරීම සඳහා උපරිමය පවුල් මිලියන 2.4ක් වන ප්‍රමාණයකින් සුදුසුකම් ලබන මුළු පවුල් ප්‍රමාණය සංශෝධනය කිරීම.

*************